# කන්ද උඩරට ප්‍රදේශයේ රෝමානු කතෝලික සහ හින්දු ආගම්වල ව්‍යාප්තිය

*ටී.ජී.ඒ. තල්වත්ත* [1]

***ABSTRACT***

***Roman Catholicism and Hinduism were established in the Kandy Region due to three major reasons. They are royal sponsorship, the conflicted Situation in Kandy region and the activities of missionaries. The last kingdom in Sri Lanka. They have moved into the Kandian Kingdom for safety when Portuguese ruler was ruined and it caused some impanel to Buddhism was the kandian region. It was considered the unclear for the safeguarding of Buddhism. The distinguished feature to be noted is that the flourishing Roman Catholicism in this region before establishing higher ordination in 1753 A.C. The Portuguese who come to Ceylon in 1505 establishing their religion at their will in the Coastal areas. At this time Buddhism was in danger. Robert Nocks has mentioned in his book about the catholic's who lived during this period***

## *හැඳින්වීම ( Introduction)*

ශ්‍රී ලංකාවේ අවසාන දේශපාලන බල කේන්ද්‍රය වූ කන්ද උඩරට රාජධානිය සිංහල බෞද්ධ උරුමය ආරක්ෂා කළ ප්‍රධාන ප්‍රවාහය බවට පත් විය. ක්‍රි.ව. 1505 දී මෙරටට පැමිණි වෙරළබඩ තීරයේ පාලකයන් වූ පෘතුගීසීන් රිසි සේ ආගමික කටයුතු ව්‍යාප්ත කිරීමත් සමඟ බෞද්ධාගමට දැඩි තර්ජන පිළිබඳවය. දළදා වහන්සේ උඩරටට වැඩම කිරීමෙන් පසු බෞද්ධාගමේ ආරක්ෂිත භූමිය වූයේ මහනුවර යි. විශේෂයෙන් ම දහඅට වැනි සියවස වනවිට ලන්දේසී බල වර්ධනය හමුවේ පහතරට ප්‍රදේශයේ රෙපරමාදු ධර්මය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. නව ආගමික පසුබිම රෝමානු කතෝලිකයන්ට තර්ජනයක් වූ අතර ඔවුන්ට අවශ්‍ය රැකවරණය කන්ද

[1] **Mr.TGA Thalwaththa.Lecturer (Transitional) Grade,BA (Hons)in History (PDN) MA (PDN) M.phil (KLN) Department of Humanities E-mail: ajiththalwatte@gmail.com**

උඩරට තුළ සැකසුණේ ය. දෙවන විමලධර්මසූරියගෙන් (ක්‍රි.ව. 1687-1707) පසු වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහට (ක්‍රි.ව. 1707-1739) දරුවන් නොමැති වූ නිසා වඩුග වංශිකයන්ට මෙරට සිහසුනට උරුමකම් කීමට හැකි වූ බව පෙනේ. එතැන් පටන් හින්දු සිරිත් විරිත් රජවාසල තුළට පමණක් සීමා නොවී රාජධානිය පුරා පැතිරෙන්නට විය. හින්දු බලපෑම පොළොන්නරු යුගයෙන් පසු බෞද්ධාගම සමඟ පුළුල්ව සම්මිශ්‍ර වේ. මෙම හින්දු ආගමනය උඩරට බෞද්ධාගමට ද ක්‍රමිකව හරස් වූ බව පෙනේ. හින්දු සහ රෝමානු කතෝලික බලපෑම දහඅට වැනි සියවස තුළ බුදුදහමට කවර ආකාරයෙන් තර්ජනයක් වූයේ දැයි මෙමඟින් හඳුනාගැනීම අපේක්ෂිත අරමුණ වේ.

## ක්‍රමවේදය (Methodology)

පර්යේෂණයට අවශ්‍ය දත්ත ලබාගැනීමේදී පුස්තකාල, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන ද මූලාශ්‍ර ලෙස භාවිත කර ඇත. මෙම අවධිය පිළිබඳ තොරතුරු ලබාගැනීමේදී ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර යොදාගත් අතරම ජනශ්‍රැති කෙරෙහි ද අවධානය යොමු කළෙමු. ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍ර ලෙස මහාවංශය, රාජාවලිය, පූජාවලිය, සුළු රාජාවලිය, සංඝරාජ සාධුචරියාව, දළදාවංශය, මන්දාරම්පුර පුවත සහ එදා හෙළදිව යන කෘති යොදා ගන්නා ලදී. මෙම අවධිය ගැන මනා අවබෝධයක් ඇති විද්වතුන්ගේ අදහස් ද අතිශයින් වැදගත් විය.

ලක්දිව කතෝලිකයන් ගැන පළමු වරට අසන්නට ලැබෙන්නේ ක්‍රි.ව. හයවැනි සියවසේදී ය (සිරිවීර 2001:335-350). මේ සමය වනවිට ඊජිප්තු සහ පර්සියන් වැසියන් මෙරට වෙළඳාමට පැමිණි අතර ඔවුහු "නෙෂ්ටොරියන්" නම් නිකායට අයත් ක්‍රිස්තු ලබ්ධිකයෝ වූහ. දේශීය වශයෙන් ඔවුන් මෙරට ආගම් ව්‍යාප්ත කිරීමට උත්සාහ නොකළ අතර, බෞද්ධාගමට ද තර්ජනයක් නොවීය. එනමුත් අප මුලින් පෙන්වා දුන් පරිදි ක්‍රි.ව. 1505 මෙරටට පැමිණි පෘතුගීසීන්ගේ ප්‍රධාන පරමාර්ථයක් වූයේ ආගම ව්‍යාප්ත කිරීමයි. පෘතුගීසිහු සිය බලය තහවුරු කරගැනීම සඳහා ආගම ප්‍රධාන සාධකයක් කර ගත්හ. ධර්මපාලගේ රූපයට ඔටුනු පැළඳවීම සඳහා ලිස්බන් නුවරට ගිය ලංකා තානාපතියන් සමඟ පෘතුගීසි පූජකවරු මෙහි පැමිණියහ (සෝමරත්න 1960:92-98). කෝට්ටේ රජුගේ ආරක්ෂාව සහ පෘතුගීසීන්ගේ අනුබලය ලත් පූජකවරු ලක්දිව ලබ්ධි ප්‍රචාරයෙහි නිරත වූහ. ධර්මපාල (ක්‍රි.ව.1551-1597) බෞතීස්ම වීමත්, ක්‍රි.ව 1556 ධීවර ජනතාව ප්‍රසිද්ධියේ ක්‍රිස්තු ලබ්ධිය වැළඳගැනීම සහ ප්‍රැන්සිස් ෂාවියර් පියතුමා යාපනයේ ශිව භක්තිකයන් කතෝලික කරවීම යන සිද්ධීන් හේතුකොටගෙන කිතු සමය වඩාත් ජනප්‍රියභාවයට පත් විය.

රොබට් නොක්ස් ලංකා සමාජයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳව ඉතා වැදගත් තොරතුරු රැසක් ඉදිරිපත් කර ඇත. එදා උඩරට සමාජයේ කතෝලිකයන් පිළිබඳව සඳහන් තොරතුරු ද ඉතා වැදගත් වේ. "මහනුවර කතෝලිකයන්ට පල්ලියක් නැත. පූජකයන් නැත. තමන්ගේ ගෙවල්වල රැඳී යාච්ඤා කරති. ඉරු දින වැඩ නොකරති. එදින යාච්ඤාවේ යෙදී සිටිති. ඔවුහු තම දරුවන්, ජලය රැගෙන පියා, පුත්‍රයා, ස්ප්‍රීතු සහ සාන්තු යන නමින් බෞතීස්ම කරති. ඔවුන්ට ක්‍රිස්තියානි නම් දෙන අතර කරේ කුරුස එල්ලාගෙන බෞද්ධ ඇදහිලි මිශ්‍ර වී තිබේ (නොක්ස් 1997:245-251). මෙවැනි පසුබිමක් උඩරට කතෝලිකයන් අතර පැවතියත් ක්‍රමික ලෙස ස්වකීය බලය ගොඩනගාගත් බව කිව හැකිය.

පෘතුගීසීන් පැමිණ නොබෝ කලකින් උඩරට රාජධානියේ ද කතෝලික බල ව්‍යාප්තියක් සිදු වේ. විශේෂයෙන් ම පෘතුගීසි බලය බිඳවැටී උඩරට පිළිසරණ සොයා ගිය රෝමානු කතෝලිකයන්ගෙන් ද බුද්ධාගමට සිදු වූයේ විපතක්ම ය (වාචිස්සර 1960:41). උඩරට රාජධානිය පෘතුගීසි පාලනයෙන් මිදී පැවතිය ද කතෝලික දේවස්ථානයක් මුලින් ම ඇරඹුණේ ක්‍රි.ව. 1543 ජයවීර රජුගේ කාලයේය (සෝමරත්න 1960:70). විශේෂයෙන් ම එය ඉදිකිරීම සඳහා ජයවීර රජුගෙන් අවසර ඉල්ලා ඇත්තේ 'පස්කෝල්' නම් දේවගැතිවරයෙකි (සන්නස්ගල 1961:720). දාහත් වැනි සියවස ආරම්භයේ ෆ්‍රැන්සිස්කන් දෙව්මැදුරක් මහනුවර පැවැති අතර එය "යහපත් ජේසුතුමාගේ දෙව් මැදුර" යයි නම් කර තිබුණි. එනමුත් මෙම අවධියේ කතෝලික ආගමේ බල වර්ධනයක් හෝ ව්‍යාප්තියක් සිදු නොවේ. මෙහිදී පැහැදිලි වන ප්‍රධාන කරුණක් වන්නේ ස්වල්ප වශයෙන් හෝ කතෝලික ජනගහනය මහනුවර රාජධානියේ වර්ධනය වන්නේ පෘතුගීසි බලය දුර්වල වී ඔවුන් උඩරට රාජ්‍යයට තර්ජනයක් නොවූ කාලයේදී ය. ලන්දේසීන් පහතරට කතෝලිකයන්ට පීඩනය ආරම්භ කළ විට දෙවන රාජසිංහ රජ (ක්‍රි.ව.1637-87) ඔවුන්ට උඩරට රැකවරය ලබාදුන්නේ ය (Colamunne 1985:09). කතෝලික ජනතාව සියයක් පමණ උඩරට පැමිණ රැකවරණය ලබාගත්තහ (සෝමරත්න 1960:70). එසේ පැමිණි අය රත්නපුර, අවිස්සාවේල්ල, රුවන්වැල්ල, නුවර සහ වහකෝට්ටේ යන ප්‍රදේශවල පදිංචි වූහ (එම:70).

මෙසේ පැමිණ පදිංචි වූ කතෝලිකයින් ක්‍රමිකව සිය අණසක පතුරවමින් උඩරට රජුගේ අනුග්‍රහය යටතේ බෞද්ධාගමට එරෙහිව දැඩි ව්‍යාපාරයක් ගෙනගිය බව පෙනේ. සෙංකඩගල ප්‍රභූවරුන් කතෝලික ලබ්ධිය වැලඳගැනීම නිසා ස්වකීය ආගම ප්‍රචාරයට පහසු මගක් උදා වූ බව පෙනේ. කරල්ලියද්දේ, ජයවීර, දෝන කතිරිනා, දොන් ජෝන්, කොනප්පු බණ්ඩාර, දොන් පිලිප්, තිකපිටියේ බණ්ඩාර, මාතලේ විජයපාල, දොන් සමරකෝන්, සීමන් කුරේ, දොන් ජැරනිමෝ සහ අලගියවන්න මොහොට්ටාල ආදී ජන නායකයින් ආගම වැලඳගැනීමත් සමඟ ඇතැම් සිංහලයෝ ද එම මග අනුගමනය කළහ. මේ සිංහල අධිපතින් හා සමඟ

අනුගාමිකයින් ද සිය ගණනින් ක්‍රිස්තු සමය වැලඳගත් හෙයින්, මහනුවර රාජ්‍ය මධ්‍ය කාලය වන විට ඇතැම් සිංහල ගම් නියම්ගම් ගණනාවක් තුළ කතෝලිකයන් දක්නට ලැබුණි (අබේසිංහ 1966:197).

ලන්දේසීන් මෙරටට පැමිණීමෙන් පසු කතෝලික ආගමේ බලය පිරිහෙන්නට විය. ඔවුහු ප්‍රධාන සතුරා ලෙස බෞද්ධයන් හෝ බෞද්ධ භික්ෂූන් නොසැලකූ අතර, කතෝලිකයන් සහ රෝමානු කතෝලික පූජකවරු එසේ සැලකූහ (වාචිස්සර 1960:42). කොළඹ පාලනය සියතට ගත් ලන්දේසීහු ක්‍රි.ව. 1658 දී කතෝලික පාදිලි කෙනෙකුට නවාතැන් දීම, මරණීය දණ්ඩනය ලබා දිය හැකි සුදුසු වරදක් ලෙස පෙන්වා දුන්හ. (ගුණවර්ධන 1974:31). හෙන්ද්‍රික් බැකර් ආණ්ඩුකාරවරයා කතෝලික නිකායෙහි චාරිත්‍රයක් වූ රූප වන්දනය තහනම් කොට බරපතල දඬුවම් පැනවූ අතර, පන් ගොලැන්ස් ආණ්ඩුකරු පූජක තනතුරු සඳහා අධ්‍යාපනය හැදෑරීම තහනම් කළේය(සන්නස්ගල 1961:723). මෙසේ කතෝලිකයන්ට හිරිහැර ඇතිවන්නට පටන් ගත් කල්හි සිංහල රජවරු ඔවුන්ට උපකාරී වූහ. දෙවන විමලධර්මසූරිය, (ක්‍රි.ව. 1687-1707) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ, (ක්‍රි. ව. 1707-1739) ශ්‍රී විජය රාජසිංහ (ක්‍රි.ව. 1739-1747) සහ කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි.ව. 1747-1781) යන රජවරුන් මේ අතර වැදගත් වේ(සෝමරත්න 1960: 83).

දෙවන විමලධර්මසූරිය (ක්‍රි.ව.1687-1705) බෞද්ධ භික්ෂූන් යටතේ හැදී වැඩුණු කෙනෙක් වුවද කතෝලික පූජකයන්ට අනුග්‍රහය ලැබුණු බව පෙනේ. විශේෂයෙන් ම ජුසේවාස් පියතුමා ඇතුළු කතෝලික පියවරුන්ට සහ කතෝලිකයන්ට නොයෙක් අයුරින් උපකාර කර ඇත. සිංහලයේ අවසන් රජු වූ වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (ක්‍රි.ව. 1707-1739) සමයේදී ද උඩරට පුරා කිතුනු ආගම ජනප්‍රිය භාවයට පත් විය(මිරැන්ඩෝ 1989: 20-22). මෙම රජවරුන්ගේ අනුග්‍රහය උඩරට කතෝලික පල්ලි ඉදිකිරීමටද, පෙරහැර පැවැත්වීමට හා වෙනත් භක්ති පූජාවන්ට අවසර ලැබුණි. නරේන්ද්‍රසිංහ රජු දේව මෙහෙය පවත්වන දිනවල දේවස්ථානයට ඉටිපන්දම් පවා යවා ඇත(සෝමරත්න 1960: 83). මෙම සිදුවීම් නිසා කිතුනු ආගම ශීඝ්‍රයෙන් වර්ධනය වන අතර බෞද්ධාගමට දැඩි තර්ජනයක් එල්ලවිය. මෙම කාලයේදී ජාකොමෙ ගොන්සාල්වෙස් හා ඉග්නේෂස් ද අල්මේදා යන කතෝලික පියවරුන් නරේන්ද්‍රසිංහ රජුගේ සහයෝගය ඇතිව උඩරට රාජ්‍යයේ මිෂනාරී කටයුතු ව්‍යාප්ත කළ බව පෘතුගීසි මූලාශ්‍රවල දක්නට ලැබේ(දේවරාජ 1997: 231). මෙම පූජකවරුන් දෙදෙනාට තම මුදියන්සේලාට දක්වන ආචාරශීලීත්වය, නම්බු නාම්බු හා ගරු සැලකිලි දැක්විය යුතුයැයි රජු අණ කළ බව කියනු ලැබේ(එම1997:231). විදේශීය පිරිසක් කෙරෙහි මෙපමණ විශේෂත්වයක් දැක්වීම පිළිබඳ උඩරට භික්ෂූන් වහන්සේ මෙන්ම රදලවරු ද අසතුටට පත් වූහ.

ශ්‍රී විජය රාජසිංහ (ක්‍රි.ව. 1739-1747) සමයේදී පෙර අවධිවල මෙන් කතෝලික දහම යම් පමණකට ව්‍යාප්ත නොවූ බව පෙනේ. ඊට හේතුව වූයේ මේ සමයේ සරණංකර හිමියන් සමඟ ගොඩනැගෙන බෞද්ධ පුනර්ජීවනයත්, උපාය ප්‍රවීණ වූ ලන්දේසීන් බුද්ධාගමේ දියුණුවට බලපාන කටයුතුවලට උපකාර කිරීමත් ය. මෙරට උපසම්පදාව පිහිටුවීමට භික්ෂූන් සොයනු සඳහා තැන තැන පිරිස් යැවීමට ස්වකීය නැව් දීමෙන් ලන්දේසිහු උදව් කළහ. එක් අතකින් බෞද්ධාගම පුනර්ජීවනයවීම කතෝලික ආගමේ අනුගාමීත්වයට ද බලපෑවේ ය. ගොන්සාල්වේස් වැනි පූජකවරුන් උපක්‍රම සහිතව රජු දිනාගැනීමට ගියත් සාර්ථක නොවූ බව පෙනේ. විශේෂයෙන්ම ඔහු රසකැවිලි ආදියෙන් පවා සංග්‍රහ කරමින් ශ්‍රී විජය රාජසිංහ රජුගේ සිත්ගැනීමට මහත්සි ගත් නමුත් පලක් නොවීය (එම : 101). රජ කරුණ අවධියේ සිටම ජාකොවේ ගොන්සල්වේස් ළඟින් ඇසුරු කළේය (Perera 1942:105). ඔහුගේ රාජ්‍ය සමය ඇරඹුනේ බෞද්ධ පුනරුත්ථාපනයත් සමඟ ය. මෙනිසා කතෝලික ආගමට ප්‍රසිද්ධියේ සැලකිලි දැක්වීමෙන් වැළකී සිටීමට ඔහුට සිදු වූ බව පෙනේ. ගොන්සාල්වේස් විසින් රචිත **මාතර ප්‍රත්‍යක්ෂණය** ග්‍රන්ථය බෞද්ධාගමට මෙන්ම රෙපරමාදු ආගමට පහර ගසා ලියූ ග්‍රන්ථයකි. මෙම කෘතිය මඟින් බෞද්ධාගමට සිදු වූ බලපෑම සෙවීමට පත් කළ සභාවේ අවසාන තීන්දුව වූයේ උඩරට පළාත්වලින් මිෂනාරීන් වහා පිටත්විය යුතු බවයි.

කීර්ති ශ්‍රී රාජසිංහ සමය වන විට බෞද්ධාගමේ ප්‍රබල ප්‍රබෝධයක් හටගත්තේ ය. මේ බව අවබෝධ කරගත් මිෂනාරීහු කපටි පිළිවෙතක් අනුගමනය කරමින් රජුගේ නායක්කර් ඥාතීන්ගේ උපකාරයෙන් නැවත උඩරට පළාත් තුළ ක්‍රියාත්මක වූහ. ක්‍රි.ව. 1748 අප්‍රේල් මාසයේ නැවත උඩරට රාජධානියට කැඳවන තෙක් විවිධ උපක්‍රම භාවිත කිරීමට ඔවුහු යුහුසුලු වූහ. විශේෂයෙන් ම මතියස් රොඩ්රිගස්, ඇලෙක්සෙන්ඩර් මැනුවෙල් යන පියවරු තමන් කලක් භුක්ති විඳි විශේෂ තත්ත්වය ලබාගැනීමට පරිශ්‍රමයෙන් ක්‍රියා කළහ(Kolamunne 1985:196). කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පියා වූ නරේනප්පා මුදල්වලට දැඩි ලොල්භාවයක් දැක් වූ අයෙකු ලෙස ප්‍රසිද්ධ ය. ඔහුට මුදල් ලබාදී උඩරට පල්ලි ඉදිකිරීමට හැකි වෙතැයි මිෂනාරීන්ගේ අපේක්ෂිත පරමාර්ථ ඉටු නොවීය. ඊට බලපෑවේ ප්‍රමාණවත් තරම් මුදල් මිෂනාරීන් සතුව නොමැතිකම යි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු පෙර පරිදි වරින් වර සිංහල කතෝලිකයන්ට උපකාර කළ අතර, රජු සහ බෞද්ධයන් අතර කිසියම් දුරස්ථවීමක් එමගින් සිදුවිණ(සෝමතිලක 2005:20). සත්‍ය වශයෙන්ම පෙර සිටි ශ්‍රී විජය රාජසිංහට ද මෙබඳු ප්‍රශ්නවලට හා විරුද්ධතාවන්ට මුහුණදීමට සිදු වූ බව පෙනේ (එම:20). එබැවින් රජවරුන් දෙදෙනාගේ ම කාලයේදී රෝමානු කතෝලිකයිනට හිරිහැර කිරීම ද සිදුවූ අතර, එය බෞද්ධයන් තුළ එම

රජවරුන්ගේ ආගමික ලැදියාව පිළිබඳ සැකය දුරුකරවා ගැනීමේ අපේක්ෂාවෙන් ම සිදු කරන ලද්දක් බව පෙනේ(හෝල්ට් 2002:163).

උඩරට රාජධානි සමයේදී බෞද්ධ භික්ෂූන් වහන්සේට ද මිෂනාරීන්ගෙන් සෘජු බලපෑම් එල්ල වූ අවස්ථාද දක්නට ලැබේ. මහනුවර මහ පෙරහැරින් කොළඹට පැමිණ, එමඟින් මාතරට ගිය එක්තරා නායක භික්ෂුවක් ගොන්සාල්වේස් විසින් බෞතීස්ම කරනු ලදුව මෙය රටවැසියා දැනගනිතියි බියෙන් මසෙලීන් නමින් කුලවැද්දුම් කරවා ඔහු ගෝවට යවන ලදී(දේවරාජ 1997:130). නමුත් මෙම සිදුවීමෙන් උඩරට මහජනයා තුළ කැලඹීමක් හටගත්තේ ය. මෙම මිෂනාරීන් බෞද්ධ භික්ෂූන් වහන්සේලා වසදී මැරූ බවට මන්දාරම්පුර පුවතේ ද සඳහන් වේ (මන්දාරම්පුර පුවත 1958:66). එසේම වැලිවිට සරණංකර සාමණේර හිමියන් ද වසදී මැරීමට තැත් කළ බවට එම කෘතියේ සඳහන් වේ (එම : 66 - 67).

ඔහු බස් ඇදහීම සත් උඩරට වසන
කිසිවෙක් නොකළේය වදහිත බික් සඟන
අදහස් මුදුන් පමුණනු වස් නොයෙක් තැන
සිල්වත් සඟුන් නෙක වැනසූ විස දෙමින

සෙංකඩගලපුරයේ කතෝලික ආගම ජනප්‍රිය වීමටත් බෞද්ධාගමට තර්ජන හටගැනීමටත් වැදගත් මෙහෙවරක් මිෂනාරීන් සිදුකර ඇත. ඔවුන් අතරින් ජුසේවාස් සහ ජාකොමේ ගොන්සාල්වෙස් යන මිෂනාරීන්ගේ භූමිකාව සුවිශේෂී වූවකි. ශ්‍රී ලංකාවේ කතෝලික ආගමේ පුනරුත්ථාපනයේ ආදි පුරෝගාමියා ලෙස සැලකෙන්නේ ජුසේවාස් පියතුම ය. ලන්දේසි පාලනයෙන් පීඩාවට පත් වූ කතෝලික ජනතාව ආත්මීය වශයෙන් පුබුදුවාලීමට මෙතුමා රහසිගත සේවයක් දියත් කළේය. ක්‍රි.ව. 1687 දී මන්නාරමට කුලීකරුවකු ලෙස පැමිණි එතුමා මැයි මාසයේදී එතැනින් යාපනයට ගියේ ය(වාචිස්සර 1960:43). එහිදී ඔහු අවුරුදු දෙක හමාරක් පමණ කතෝලික ජනතාව හඳුනාගෙන යාචකයකු ලෙස බැමතිමතුන්ගේ නිවෙසේවලට ගොස් ආගම ප්‍රචාරය කර ඇත. අනතුරුව යාපනයෙන් පිටත් වී වන්නි ප්‍රදේශයට ද එතැනින් පුත්තලමට ද පැමිණියේ ය. එකල පුත්තලම මහනුවර රාජ්‍යයට අයත්ව තිබූ ප්‍රදේශයකි (සෝමරත්න 1960:296). ඉන්පසු කම්මල, හලාවත, මුන්නේශ්වරම්, මාදම්පේ, කටුනේරිය, ඇටියාවල, මාකඳුර, මැටියගනේ යන ස්ථානවල සේවය කර අවසානයේ මහනුවරට ද පැමිණියේ ය. එවකට උඩරට දෙවන විමලධර්මසූරිය රජතුමා රාජ්‍ය පාලනය කළේය. ඔහු මෙම රජුගේ ද සහයෝගය ලබමින් මහනුවර අවට කතෝලික ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා පියවර ගත්තේය. නගරය තුළ ක්‍රි.ව. 1693 දේවස්ථානයක් ඉදිකර එහි පදිංචිවීමට රජතුමා අවසර දීමත් සමඟ ඔහුගේ අපේක්ෂා ඉටු වූ බව පෙනේ. පුත්තලමේ සහ මාන්කෝට්ටම් යන නගර දෙකේ ඔහු පල්ලි ගොඩනැඟුවේ ය (එම:279). මේ හැරුනු විට

පොල් අතු සහ ලී යොදා තැනූ පල්ලි 55ක් ඔහුගේ කාලයේ ගොඩනැගූ බව වාර්තා වේ (Kolamunne 1985: 25). කතෝලික ආගමේ මෙලෙස ඇති වූ පිබිදීම හරහා බෞද්ධාගමට ද සෘජු පහරක් වැදුණි. එනමුත් මහනුවර රාජධානිය ප්‍රදේශයේ පදිංචි වී සිටි කතෝලිකයන්ගේ බහුතරය වූයේ සරණාගතයන් ලෙස උඩරට රාජ්‍යයට පැමිණි ජනයා ය.

වර්තමානයේ දී මෙන් එදා ද අසරණභාවයට පත් ජනතාවට මිෂනාරීහු පිළිසරණ ලබාදුන්හ. ක්‍රි.ව. 1697 දී සෙංකඩගලපුරයේ වසූරිය පැතිර ගිය විට රෝගීන්ට සේවය සඳහා ජුසේවාස්තුමා විසින් අවශ්‍ය කටයුතු ඉටුකරන ලදී. ජුසේවාස් ධීවරයකු, යාචකයකු, ලස්කිරිඤ්ඤ භටයකු හෝ කම්කරුවකු ලෙස වෙස් වළාගෙන ආගම ව්‍යාප්ත කිරීමේ නිරත වූ බව පෙනේ(පෙරේරා 1946: 120) විවිධ පොත පත රචනා කරමින් ජනතාවට එම ධර්මය එත්තු ගැන්වීමට පියවර ගත්තේය. දෙමළෙන් සම්පාදනය කර තිබූ **ඥාන උපදේශ, ප්‍රාර්ථනා පාද නමස්කාර, ජපමාලා** සහ **අබිරහස්** ආදි සුළු යාඥා පොත් කිහිපයක් සංශෝධනය කිරීමෙන් හෙළ බසට නැගුවේ ය. මෙම ක්‍රියවලිය ද කතෝලික ආගම ප්‍රචලිතවීමට ඉවහල් විය.

ජුසේවාස්ගේ මරණයෙන් පසු උඩරට කතෝලික ආගම ව්‍යාප්ත කිරීම සඳහා සුවිශේෂී භූමිකාවක් ඉටුකරනු ලබන්නේ ජාකෝමේ ගොන්සාල්වෙස් ය. කතෝලික ආගමේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ ඔහු ලේඛකයකු මෙන්ම දක්ෂ කලා ශිල්පියකු වශයෙන් හඳුනාගත හැකිය. ක්‍රි.ව. 1705 දී ලංකාවට පැමිණි එතුමා මෙරට ධර්මය ව්‍යාප්ත කිරීමේ නිරත වූ බවට තොරතුරු හමුවේ(ආරියරත්න 1993:107). එතුමා සතුව පැවති සුවිශේෂී භාෂා හැකියාව සහ ග්‍රන්ථකරණය ආගම් ව්‍යාප්ත කිරීමට යොදාගන තිබේ. ග්‍රන්ථ ලිවීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ කතෝලික සිංහල ජනතාවට ආගමේ සත්‍යයන් විස්තර කරදීමය. ඇතැම් පොත් ස්වකීය සමයට ජනයා වැඩිපුර බඳවාගැනීම පරමාර්ථකොට ලියන ලද ඒවා ය. සිංහල පොත් 22 ක්, දෙමළ 25 ක්, පෘතුගීසි 4 ක් සහ ඕලන්ද පොත් 1 ක් බැගින් ලියා ඇත. මෙම පොත් රචනා කිරීමෙන් කතෝලික ධර්මය ප්‍රචාරයට පමණක් නොව සිංහල භාෂාවේ වර්ධනයට ද උපකාරී විය. ගොන්සාල්වෙස්ගේ විවාදාත්මක ලේඛන හතරකි. **මාතර ප්‍රත්‍යක්ෂය, අඥාන ඖෂධය, භේදකාරයින්ගේ තර්කය** සහ **බුදුමුල** යන ග්‍රන්ථ මේ අතර වේ. **භේදකාරයින්ගේ තර්කය** නමැති කෘතියෙන් සඳහන් වන්නේ මහනුවර මැති ඇමතිවරුන් ඉදිරියේ නන්ක්ලෙයා ද ලැනරෝල් නැමති රෙපරමාදු වාදිය සමඟ කළ වාදයේදී ඉදිරිපත් කළ තර්කයන් ය (සන්නස්ගල 1961:724). වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ සමය වන විට උඩරට ප්‍රබල භූමිකාවක් ජාකොමේ ගොන්සාල්වෙස් ද ඉටු කර ඇත. ඔහු රජතුමාගේ ඉතා විශ්වාසවන්ත, සමීප අයකු ලෙස කටයුතු කර තිබේ. හෙතෙම ප්‍රසිද්ධියේ මහනුවර සහ හඟුරන්කෙත යන ප්‍රදේශවල ධර්මය ප්‍රචාරය කළේය.

(සෝමරත්න 1960:310). මෙවැනි තත්ත්වයක් තුළ බෞද්ධාගමට කවරාකාරයේ කාලපරිච්ඡේදයක් උදා වූවාද කියා වටහාගත හැකිය. අසරණභාවයට පත් කතෝලික ජනතාව පහතරට ප්‍රදේශයේ සිට උඩරට පදිංචි කිරීමෙන් අනතුරුව, ක්‍රමිකව බෞද්ධාගමේ ඉදිරි ගමනට බාධාවක් වූ බව පෙනේ. එක් අතකින් මහනුවර රජුගේ අනුග්‍රහය ද තවත් විටෙක පූජකතුමන්ලාගේ ක්‍රියාකාරීත්වය තුළ ව්‍යාප්ත වූ කතෝලික ආගම බෞද්ධයන්ට පැහැදිලිව තර්ජනයක් විය(ආරියරත්න 1993:2-11). මෙහි විශේෂත්වය වන්නේ පෘතුගීසි පාලනය මෙරටින් තුරන් වූ පසු එම තර්ජනය ඇති වීමයි. පහතරට දී එල්ල වූ තරම් අභියෝගයක් උඩරට ප්‍රදේශයේ බෞධද්ධාගමට ඇති නොවුණි. එනමුත් සමකාලීනව එල්ල වූ කතෝලික බලපෑම උපසම්පදාව පිහිටුවීමෙන් පසු අඩපණ වූ බව පෙනේ. තවද රෙපරමාදු ආගමේ බලපෑම උඩරට බුදුසමයට එතරම් දැනුනේ නැති බව පැහැදිලි වන කරුණකි.

දහඅට වැනි සියවසේ උඩරට බුදුසමය පිළිබඳ සිදු කරනු ලබන කතිකාවේදී පසක් වන ප්‍රධාන ප්‍රස්තුතයක් වන්නේ හින්දු සමය ප්‍රබල මට්ටමකින් ක්‍රියාත්මක වූ බවයි. තත්කාලීනව සමාජයේ ඇති වූ වෙනස්වීම් බෞද්ධාගමට ද සෘජුව බලපෑවේ ය. ගම්පොළ හා කෝට්ටේ රජුන්ගේ කාලයේ ලංකාවට පැමිණි විවිධ වර්ගයේ දකුණු ඉන්දියානු ද්‍රවිඩයෝ මේ රටේ සිංහල සමාජයට ඇතුළු වූහ(ආරියරත්න 1993: 2-11). දකුණු ඉන්දියානු හින්දු සංස්කෘතිය ලක්දිව පැතිර යාම නිසා දෙවියන් ඇදහීමත් දෙවියන්ගේ පිහිට බලාපොරොත්තුවෙන් පුද සිරිත් පැවැත්වීමත් බහුල විය. ඉන්දියානු දෙවියන් වූ විෂ්ණු, කාර්තික, පත්තිනි, විභීෂණ යන දෙවිවරුන් උදෙසා දේවාල කෝවිල් කරවා ඒවායේ නඩත්තුව සඳහා සිංහල ද්වීපයෙහි විශාල භූමි භාගයක් දෙවොල් ගම් වශයෙන් වෙන් කිරීමට පාලකයෝ ක්‍රියා කළහ. මෙරට ජනතාව ද ඒවායේ රාජකාරි සේවාව සඳහා යොමු කළ බව පෙනේ. මෙවැනි පසුබිමක් තුළ ජන සමාජයෙහි දේව ඇදහිල්ල වඩාත් ජනප්‍රිය විය.

ක්‍රමයෙන් දිවයින පුරා පැතිරී තිබුණු හින්දු ආගමේ වර්ධනය වඩාත් තහවුරු කළ සාධක උඩරට රාජධානි සමයේ ආරම්භයත් සමඟ ම ඇති විය. පහළොස් වැනි හා දාසය වැනි සියවස්වල දකුණු ඉන්දියාව වෙත එල්ල වූ මුස්ලිම් ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස එපෙදෙස් වැසි බ්‍රාහ්මණ ජනයා ලංකාවට පැමිණියහ (එම:51-51). එසේ පැමිණි ඔවුහු දේශීය පාලකයන් සහ රදලවරුන්ට බලපෑමක් ඇති කිරීමට සමත් වූහ. අතීතයේ සිටම හින්දු සමය මෙරට ජනප්‍රියව පැවතීමත්, පළමුවන රාජසිංහ රජු (ක්‍රි.ව. 1578-1592) ශිවාගම වැළඳගැනීමත් යන හේතු නිසා හින්දු සමය සීතාවක රාජධානි යුගය තුළ ඉදිරියට පැමිණියේය. ක්‍රමිකව වර්ධනය වූ හින්දු ආගම දිවයිනේ සෙසු ආගම්වලට තර්ජනකාරී බලවේගයක් වූ බව පෙනේ.

නායක්කර් රජවරු බෞද්ධයන් බවට හැරුණ ද හින්දු පුද සිරිත් හා චාරිත්‍ර දිගටම පවත්වා ගෙන ගියහ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ක්‍රි.ව. 1798-1815) බෞද්ධ වෙහෙර විහාර ආදියට අනුග්‍රහ කරමින් බෞද්ධ රජෙකු ලෙස කොතෙක් ක්‍රියා කළේ වී නමුත් ඔහුගේ ඥාතින් ශරීරයෙහි අළු ගෑම වැනි හින්දු චාරිත්‍ර ගරු කළ බව ඇහැලේපොළ වර්ණනාවෙහි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ඥාතීන්ට අපහස මුඛයෙන් කෙරෙන "මෝරු බී බී තේරුව මහ ඌරු කැලක් සේ දෙමළුන් සෙරු-පුහුල් ලෙස අළු හොඳ සීරු ලෙස ගගා" (වාචිස්සර 1970:477-478). යන වර්ණනයෙන් පෙනේ. වැලිවිට සරණංකර තෙරුන්ගේ ප්‍රධාන අනුග්‍රහකයා බවට පත්ව සිටි කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1747-1781) ද මෙබඳු දැඩි ශිව බැතිමතෙකු වූ අතර සෙසු පාලකයන් විසින් කරනු ලැබූ නළලෙහි අළු ගෑමේ සිරිත පවා ඔහු අත් නොහළ තැනැත්තෙකු බව කියැවේ (සෝමතිලක : 164-165). රජු මරා දමා වෙනත් කෙනෙකු පාලකයා ලෙස පත් කරගැනීමට බෞද්ධ ප්‍රභූ භික්ෂු පිරිසකගේ මැදිහත්වීමෙන් එකල කුමන්ත්‍රණයක් පවා ක්‍රියාත්මක කරන ලද්දේ නායක්කර්වරුන් තුළ පැවති හින්දු ආගමික නැඹුරුව නිසා ය (සෝමතිලක 2005: 24). කීර්ති ශ්‍රී රාජසිංහ රජු මුන්නේශ්වරම් වැනි හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කළ බව සඳහන් වේ (සූළුරාජාවලිය 1959 :1-12).

විශේෂයෙන් ම මහනුවර අවධියෙහි ලක්දිව ඉඩම් දේවාලවලට යටත්කොට දේවාලගම් කිරීම නිසා සමාජයෙහි හීන දීන තත්ත්වය ක්‍රමයෙන් දියුණු විය. තවද වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් මදුරාපුරයෙන් බිසෝවරුන් සහ ද්‍රවිඩ කුමාරවරුන් ගෙන්වා ගැනීමෙන් පසු මෙරට සිටි දකුණු ඉන්දියානුවන්ගේ බලය වැඩි වූ බව පෙනේ. මෙනිසා අප්‍රධානව සිටි දකුණු ඉන්දීය දෙවිවරුන් හා, යකුන් ඇදහීම සහ තේවාවන් ඉටු කළ කපු මහත්වරුන්ට සමාජයෙහි උසස් තැනක් ලැබුණි. මහනුවර ඇසළ පෙරහර පවත්වන ලද්දේ ද්‍රවිඩ දෙවිවරුන්ට සිදු කරන පූජාවක් වශයෙනි. සමාජයේ ඇති වූ මෙම වෙනස්වීම බෞද්ධ භික්ෂුවට සහ පිළිවෙත්වලට බලපාන ලදි. දේව විශ්වාස බුදුදහම සමඟ සම්මිශ්‍ර වූ අතර පිරිත් පින්කම් යනාදිය භික්ෂු ශාන්ති කර්මයන්හි ස්වභාවය ඉසිලීය. මේ නිසා සිංහල බෞද්ධ සංස්කෘතියේ ප්‍රබල විපර්යාසයක් හටගත්තේය.

ශ්‍රී ලංකාවේ බෞද්ධාගමිකයෝ බොහෝ අවස්ථාවල හින්දු දෙවියන්ගේ පිහිට පැතූ පිරිසක් වූහ. විහාර සංස්ථාව සහ දේවාල සංස්ථාව යන දෙකම රජයේ පිළිගැනීම මෙන්ම අනුග්‍රහය ද ලැබ එකට ම පැවතීම තුළින් බෞද්ධාගම සහ හින්දු ආගම සුසංයෝගීව පැවතෙන අන්දම මූර්තිමත් කරයි(දේවරාජ 1997:243). උඩරට සමයේ මෙවැනි තත්ත්වයක් හටගැනීමට හේතු වූයේ ක්‍රි.ව. 1739 නායක්කර් රජවරු පැමිණීමත් සමඟ ස්වකීය රාජ්‍යත්වය ආරක්ෂා කරගැනීමට බෞද්ධාගමට අනුග්‍රහය දක්වා, තම බිසෝවරුන්ගේ වන්දනාමාන කටයුතු සඳහා දේවාල ඉදිකිරීමට කටයුතු කළහ. මේ නිසා දේවාගම වඩාත් ජනතාව අතර ප්‍රචලිත විය. එය

වඩාත් පැහැදිලි වන්නේ බෞද්ධ ජනතාවගේ මුදුන්මල්කඩ වූ දළදා මාළිගාව අබියස ඇති නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන දේවාල ඉදිවීමයි(සෙනවිරත්න 1989:98-99). මෙම සතර දේවාල තුළ පිළිබිඹු වන්නේ රජවාසලත්, දළදා මාළිගාවත් සමඟ දීර්ඝ කාලයක් මුළුල්ලේ පැවති සම්බන්ධතාව යි.

මහනුවර මහවාසලට තුදුරින් පිහිටි සතර දේවාලවල ශ්‍රී විජය රාජසිංහ රජුගේ කාලයේ සිටම එම දේවාල සතරෙහි පෙරහැර උත්සව පවත්වා ඇත. දළදා පෙරහැර දේවාල පෙරහැරවලට සම්බන්ධ කෙරුණේ සරණංකර හිමියන්ගේ ආයාචනයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ පාලන සමයේ දීය (Mirando1994: 108). මෙම යුගය තුළ පත්තිනි දෙවියන් ඉමහත් ප්‍රසිද්ධියට පත්ව සිටියේ ය. ඇය ඇසළ පෙරහැරේ ගෞරවයට පාත්‍ර වූ දෙවිවරුන් සිව්දෙනාගෙන් කෙනෙකි. හින්දු ධර්මයේ බලපෑම දෙවිවරුන් සම්බන්ධයෙන් දේශීය ජන කොටස් අතර පැවති ඇදහිලි විශ්වාස පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. මෙම යුගයේ බලවත් දෙවි කෙනෙකු වූ විෂ්ණු දෙවියන් දිවුරුම් කළ යුතු අවස්ථාවන්හිදී විෂ්ණු දෙවියන්ගේ නාමය ද සඳහන් කොට දිව්රීම එවකට සිරිත විය. විෂ්ණු දෙවියන් උදෙසා උත්සව පැවැත්වීම ද ඇසළ පෙරහැරේ අංගයකි.

වර්තමානයේ දළදා වහන්සේ වෙනුවෙන් සිදු කරනු ලබන තේවාව හා බැඳුණු චාරිත්‍ර තුළ ද එවකට සිදු වූ හින්දු ආගමේ බලපෑම ඉන් ගම්‍ය වන්නේ ය. තේවාවට ගන්නා උපකරණ අතර තාලන්විය, (තේවාවට ගන්නා පඩික්කම) පයිඩ කරනවා යන ඒවා ද්‍රවිඩ බලපෑම මත සකස් වූ වචනයි. දළදා වහන්සේ වෙනුවෙන් පවත්වනු ලබන නානුමුර මංගල්‍යය ද දකුණු ඉන්දියානු හින්දු කෝවිල්වල සිදු කරන චාරිත්‍රවලට සමාන ය. ආලත්ති අම්මාවරුන් විසින් ඉටු කරන දළදා පෙරහැර සහ දළදා ප්‍රදර්ශන අවසානයේ ඇස්වහ සහ කටවහ පිච්චීම හින්දු බලපෑම මත වර්තමානයේ ද සිදු කරනු ලබයි. මෙම සිදුවීම් විචාරාත්මකව බැලීමෙන් පසක් වන්නේ ඉතා දැඩිව හින්දු බලපෑම පවතින බවකි.

එදා උඩරට රාජධානි සමයේ පැවති සිව් මහා දේවාලයන්ට පරිබාහිරව තවත් දේවාල උඩරට රාජ්‍ය පුරා විසිර පැවතිණ. මෙහි පුරාණ චාරිත්‍ර සිදු කර ඇත්තේ කපුරාළවරුන් විසින් ය. විහාරවල මෙන්ම දේවාල සතුව ද ඒවායෙහි නඩත්තුව සඳහා රජවරුන් විසින් පුදන ලද විශාල ඉඩකඩම් ඇත. සතර මහා දේවාල හා පරිවාර දේවාල පාලනය කිරීම බස්නායක නිළමේ නම් පුද්ගලයාට භාර විය. ඔහු පත් කිරීම රජතුමා විසින් සිදුකර ඇත. ඒ තුළින් පැහැදිලි වන්නේ දේවාල පිළිබඳ කටයුතු සඳහා උඩරට රජුගේ ඍජු මැදිහත් වීමක් පැවති බවයි. විශේෂයෙන් ම ක්‍රි.ව. 1815 මාර්තු 2 දින අත්සන් කළ උඩරට ගිවිසුමේ ජනතාවගේ දේවාගම පිළිබඳ සඳහන් තිබීමෙන් මෙම සමාජයේ දේවාගම ජනප්‍රියව පැවතුණා ද යන්න

පැහැදිලි වේ. මෙලෙස උඩරට බෞද්ධ සමාජය තුළ දේශපාලන අරමුණු ඉටු කරගැනීමට පාලකයා බුදුදහමට අනුග්‍රහය දැක්වුව ද අඩුවක් නොමැතිව ගලා ආ හින්දු අදහස් ද සමඟ බෞද්ධාගම මහජනයාගේ සමාජ සංස්කෘතික ජීවන ක්‍රමයට ඒකාංගව බැඳී ගියේ ය. මහනුවර යුගයේ අභිනවයෙන් ඉදිවූ විහාරස්ථාන දෙස බලන විට පැහැදිලි වන්නේ විහාරස්ථානයේ අනිවාර්යෙන් ම දේව රූපයක් හෝ දේවාලයක් දක්නට ලැබීමයි. ඉන් මිදී යම් නිර්මාණ බිහි වූයේ කලාතුරකිනි.

## *නිගමනය (Conclution)*

අප මෙතෙක් සාකච්ඡා කරන ලද තොරතුරුවලින් පැහැදිලි වන්නේ රජරට සභ්‍යත්වය බිඳවැටීමෙන් පසු ශාසනයේ පරිහානිය හයවැනි පරාක්‍රමබාහු යුගයේදී නැවත පුනර්ජීවනය වූ බවයි. බටහිර ජාතීන්ගේ පැමිණීමත් සමඟ එල්ල වූ තර්ජනය නිසා නැවත සසුනෙහි පරිහානිය පටන් ගත්තේය. යුගයේ අභියෝග ජයගෙන සසුනේ වත්පිළිවෙත් ආරක්ෂා කළේ ගණින්නාන්සේ විසිනි. කතෝලික සහ හින්දු ආගම්වල බලපෑම මධ්‍යයේ උඩරට මෙන්ම පහතරට සසුන රැක්කේ ද ගණින්නාන්සේ ය. ඔවුන් විසින් රැකදුන් ශාසනික සම්ප්‍රදාය එතැන් පටන් ආරක්ෂා වන්නේ සරණංකර හිමියනගේ ධෛර්යය තුළිනි.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Reference)*


**එදා හෙළදිව** (1997). **(An Historical Relation of the Island of Ceylon)** රොබට් නොක්ස්, පරි. ඩේවිඩ් කරුණාරත්න, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

**මන්දාරම්පුර පුවත**, (1958). සංස්. ලබුගම ලංකානන්ද, මරදානඃඅතුල මුද්‍රණාලය

**චූළ රාජාවලිය**, සංස්. (1959) ඩී.පී.ආර්. සමරනායක, මරදානඃශ්‍රී ප්‍රෙස් සමාගම.

අබේසිංහ, ටිකිරි, **පරංගි කෝට්ටෙ**, (1962) කොළඹ :ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්

ආරියරත්න, සුනිල්, (1993). **ජාකොමේ ගොන්සාල්වෙස් තෝරාගත් කෘති**, සමාජ හා සංස්කෘතික ඒකාබද්ධ පදනම,

ගුණවර්ධන, ඩී.කේ. ඩබ්ලිව්. (1974) **ලංකාවේ ලන්දේසි බලය පිහිටුවීම**, අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

දේවරාජ, ලෝනා, ශ්‍රීමති, (1997) **උඩරට රාජධානිය**, පාදුක්කඃ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

වාචිස්සර, කොටගම, (1960). **සරංකර සංඝරාජ සමය**, විසිදුනු ප්‍රකාශන

සන්නස්ගල, පුංචිබණ්ඩාර, (1961). **සිංහල සාහිත්‍ය වංශය**, කොළඹඃ ලේක් හවුස්.

සෝමතිලක, එම්. (2005) **කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහා විහාරය**, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

සෝමරත්න, පී.වී.බී, අබේසිංහ, ටිකිරි සහ දේවරාජ, ලෝනා. ශ්‍රීමති,(1977) **උඩරට රාජධානිය, 1470- 1818**, කොළඹ: ලේක් හවුස් ඉන්වෙස්මන්ට් සමාගම,

සෝමරත්න, පී.වී.බී. (1960). **ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු ශාසන ඉතිහාසය 1800 දක්වා**, කොළඹ: දේව ධර්ම ශාස්ත්‍රාලය

හොල්ට්, ජෝන්, (2002) **කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික ලෝකය**, පරි. උදය ප්‍රසන්න මැද්දේගම, කොළඹ: ප්‍රදීප ප්‍රකාශන .

**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහා නාහිමි උපහාර ලිපි සංග්‍රහය**, සංස්. (2004) කොළඹ: නියංගොඩ ශ්‍රී විජිතසිරි සහ කුළුගම්මන ධම්මරක්ඛිත.

**පූජා ප්‍රසාදනී**, (2009).සංස්. කුළුගම්මන ධම්මරක්ඛිත, නැහිනිවෙල පියදස්සී, රඹුක්වැල්ලේ සෝභිත, කොළඹ: බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

**සිංහල විශ්ව කෝෂය**, (1970) සංස්. ටී.බී. කරුණාරත්න, 4 වැනි කාණ්ඩය, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

Kolamunne, T.O.R. ( 1985). **Church History of Sri Lanka 1505- 1970**, Borall.

Kolamunne, T.O.R. (1990). **Catholic Church in Sri Lanka**, Boralla.

Perera, S.G. (1942). **Life of Father Jacome Goncalves**, Galle: De Nobill Press.,